# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2496/39 - 2026 ජූලි මස 10 වැනි සිකුරාදා - 2026.07.10**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

විධාන අංක -100

**2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත (සංශෝධිත)**

10(1) (අ) වගන්තිය යටතේ විධානය

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1) (අ) වගන්තිය යටතේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ක්‍රියා කරමින් පහත උපලේඛනයෙහි දක්වා ඇති නිෂ්පාදන, ආනයනකරුවන්, නිෂ්පාදකයින්, ගබඩාකරුවන්, බෙදාහරින්නන් හා වෙළෙඳුන් විසින් එකී නිෂ්පාදන ඇසුරුමේ හෝ ලේබලයේ පහත දක්වා ඇති තොරතුරු මුද්‍රණය කර ඇත්තේ නම් මිස, එකී නිෂ්පාදන කිසිවක් ආනයනය කිරීම, නිෂ්පාදනය, ගබඩා කිරීම, බෙදාහැරීම, විකිණීම (තොග හෝ සිල්ලර), විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් විධානය කරනු ලැබේ.

<u>මුද්‍රණය කිරීමට අවශ්‍ය තොරතුරු</u>

- උපලේඛනයෙහි සඳහන් පරිදි අදාළ නිෂ්පාදන නාමය ඝන අකුරින්, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම හෝ එම භාෂා අතුරින් භාෂා දෙකකින් ප්‍රධාන රාමුව මත සහ ඕනෑම රාමුවක අනික් භාෂාවෙන් සටහන් කළ යුතුය.

- **ඇසුරුම් කරන ලද අවස්ථාවේදී** නිෂ්පාදනයේ අඩංගු සමස්ථ මේද පදාර්ථ ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස නිෂ්පාදනයේ ලේබලය මත පැහැදිලිව සහ ප්‍රකටව මිලිමීටර් 2 (මි. මී. 2) ට නොඅඩු අකුරු ප්‍රමාණයෙන් සහ ඝන අකුරුවලින් මුද්‍රණය කළ යුතුය.

1A - PG 7798 — 53 (2026/07)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

| *අනු අංකය* | *ශ්‍රී ලංකා ප්‍රමිතියේ සඳහන් නිෂ්පාදන නාමය* | *පිරිවිතරය* |
|---|---|---|
| 01 | ළදරු සබන් | ශ්‍රී ලංකා ප්‍රමිති 547 ළදරු සබන් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 02 | ඇඟ ගල්වන සබන් | ශ්‍රී ලංකා ප්‍රමිති 34 ඇඟ ගල්වන සබන් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 03 | ෂේවින් සබන් | ශ්‍රී ලංකා ප්‍රමිති 36 ෂේවින් සබන් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 04 | කාබොලික් සබන් | ශ්‍රී ලංකා ප්‍රමිති 35 කාබොලික් සබන් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 05 | රෙදි සෝදන සබන් | ශ්‍රී ලංකා ප්‍රමිති 554 රෙදි සෝදන සබන් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 06 | බේදින් බාර් | ශ්‍රී ලංකා ප්‍රමිති 1220 බේදින් බාර් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 07 | මෘදු සබන් | ශ්‍රී ලංකා ප්‍රමිති 37 මෘදු සබන් සඳහා ප්‍රමිති පිරිවිතර |

මෙම විධානය වර්ෂ 2027 ක් වූ ජූලි මස 09 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

**එස්. එම්. ඩී. සූරියකුමාර,**
සභාපති (*වැ. බ.*).

2026 ජූලි මස 10 වැනි දින,
කොළඹ දී ය.

EOG 07 - 0144

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.